**කුලියාපිටිය විශ්වවිද්‍යාල විද්‍යායතනය - 2015**

-----------------------------------------------------------

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ කුලියාපිටිය විශ්වවිද්‍යාල විද්‍යායතනයට අදාල 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 47(2) වගන්තිය සහ 2014 ඔක්තෝබර් මස 03 දිනැති අංක 1882/51 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ 17(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 49(1) වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිත උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විද්‍යායතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 පිහිටුවීම

--------------

2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 5(ඉ) වගන්තිය සමඟ කියවිය යුතු 20 වන වගන්තියේ (1) උපවගන්තිය යටතේ 2014 ඔක්තෝබර් 01 දින සිට බලාත්මක වන පරිදි වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් සකස්කරන ලද 2014 අංක 1 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල විද්‍යායතන නියමාවලිය යටතේ එහි අනුබද්ධ ආයතනයක් ලෙස කුලියාපිටිය විශ්වවිද්‍යාල විද්‍යායතනය පිහිටුවා තිබුණි. වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය විසින් අනුමත කරනු

ලබන ජාතික වෘත්තීය සුදුසුකම් 5,6 හා 7 මට්ටමේ සහ ඒ සමාන මට්ටම්වල තාක්ෂණවේදී පාඨමාලා මෙහෙයවීම ප්‍රධාන අරමුණ වේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

----------------

**2.1 මතය**

--------

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ කුලියාපිටිය විශ්වවිද්‍යාල විද්‍යායතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

------------------------------------------

**2.2.1 විගණනය සඳහා සාක්ෂි නොවීම**

--------------------------------------

විද්‍යායතනයේ සංචිත වාහනය සඳහා සමාලෝචිත වර්ෂය තුල රු.126,210 ක් වටිනා ඉන්ධන ලීටර් 1,147 ක් භාවිතා කර තිබුණද දෛනික ධාවන සටහන් හා ගමන් පිළිබඳ මාසික සාරාංශ නියමිත පරිදි පිළියෙල නොකිරීම හේතුවෙන් ඉන්ධන උපයෝජනය පිළිබඳ නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.

**3. මූල්‍ය සමාලෝචනය**

----------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාල විද්‍යායතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.667,134 ක ඌනතාවයක් විය.

**4. මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

**4.1 කාර්යසාධනය**

------------------

2014 අංක 1 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල විද්‍යායතන නියමාවලියට අනුව ජාතික වෘත්තීය සුදුසුකම් 5, 6 හා 7 මට්ටමේ පාඨමාලා සහ ඒ හා සමාන මට්ටම්වල වෙනත් තාක්ෂණවේදී පාඨමාලා මෙහෙයවීම විද්‍යායතනයේ අරමුණු ලෙස දක්වා තිබුණි. එම අරමුණු ඉටුකර ගැනීමේ කාර්ය සාධනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය විසින් අනුමත කරනු ලබන අයුරින් විද්‍යායතනය විසින් ජාතික වෘත්තීය සුදුසුකම් 5,6 හා 7 මට්ටමේ පාඨමාලා සහ ඒ සමාන මට්ටම්වල වෙනත් තාක්ෂණවේද පාඨමාලා 09 ක් සමාලෝචිත වර්ෂය තුල හඳුන්වාදී තිබුණද ඉන් පාඨමාලා 07 ක් සඳහා පමණක් සිසුන් 108 දෙනෙකු ඇතුලත් වී තිබුණි. එම සිසුන්ගෙන් 33 දෙනෙකු පාඨමාලා හැරගොස් තිබුණි.

(ආ) වටිනාකම රු.124,114,537 ක් වූ ඉගෙනුම් උපකරණ මිලදී ගෙන රසායනාගාර හා අවශ්‍ය යටිතල පහසුකම් ස්ථාපිත කර තිබුණද එක් පාඨමාලාවකට ඇතුලත් වූ එකම සිසුවාද එම පාඨමාලාව හැර යාම හා පාඨමාලා 02 කට සිසුන් ඉල්ලුම් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ පාඨමාලා 03 ක් පැවැත්වීමට නොහැකි වී තිබුණි.

**4.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාල විද්‍යායතනයේ මෝටර් රථ තාක්ෂණ පාඨමාලාවේ Wheel alignment අංශය සඳහා වටිනාකම රු.1,435,000 ක් වූ උපකරණ 2015 මාර්තු 24 දින වන විට ලැබී තිබුණද, එම උපකරණ භාවිතා කල හැකි NVQ 5 සහ 6 මට්ටම්වල සිසුන් බඳවා ගැනීමට සැලසුම් නොකිරීම හේතුවෙන් එම උපකරණ විගණිත දිනය වූ 2016 මැයි 13 දින වන විටත් භාවිතයට ගෙන නොතිබුණි.

(ආ) ගොඩනැගිලි සැලසුම් තාක්ෂණ පාඨමාලාව සඳහා ලැබී තිබුණු වටිනාකම රු.6,381,800 ක් වූ භාණ්ඩ හා උපකරණ තොගයක් විගණිත දිනය වූ 2016 මැයි 11 දින වන විටත් ප්‍රධාන ගබඩාවේ අභාවිතව තිබුණි. ගොඩනැගිලි සැලසුම් තාක්ෂණ විෂයය සඳහා අනුයුක්තව සිටි සිසුන් ප්‍රමාණය අවම වීම නිසා එම විෂයයට අදාල ප්‍රායෝගික කටයුතු ඉදිකිරීම් තාක්ෂණ සිසුන් සමඟ ඒකාබද්ධ කර එම ඉගෙනුම් උපකරණ භාවිතා කර තිබූ බව විද්‍යායතනයේ අධ්‍යක්ෂ විසින් විගණනය වෙත දන්වා තිබුණි.

**4.3 කළමනාකරණ ක්‍රියාකාරකම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාල විද්‍යායතනය පිහිටි ඉඩම හා ගොඩනැගිලි සමාලෝචිත වර්ෂය අවසාන වන විටද විශ්වවිද්‍යාලයට පවරාගෙන නොතිබුණු අතර පවරාගැනීමේ කටයුතු ප්‍රමාදවීම එහි සංවර්ධන කටයුතුවලට බාධාවක් වන බව නිරීක්ෂණය විය.

(ආ) නිපුණතා සංවර්ධන හා වෘත්තිය පුහුණු අමාත්‍යාංශයෙන් ලබාදී තිබුණු වටිනාකම රු.15,150,000 ක් වූ වාහන 02 ක හිමිකම විද්‍යායතනයට පවරාගෙන නොතිබුණි.

**4.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විද්‍යායතනයේ අනුමත කාර්ය මණ්ඩලය 53 ක් හා තථ්‍ය කාර්ය මණ්ඩලය 32 ක් වූ අතර ඉන් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 16 ක් හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 05 ක් පවතින බව නිරීක්ෂණය විය. අධ්‍යයන කටයුතු සඳහා බාහිර දේශකවරුන්ගේ සහාය ලබාගෙන තිබුණු අතර අධ්‍යයන, අනධ්‍යයන හා පරිපාලන කටයුතු විධිමත්ව හා කාර්යක්ෂමව පවත්වාගෙන යාමට පුරප්පාඩු පුරවා ගැනීම කඩිනමින් කළ යුතු බව නිරීක්ෂණය විය.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1 විගණන කමිටු**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4 ඡේදය ප්‍රකාරව විගණන කමිටුවක් පත්කර නොතිබුණි.

**5.2 අයවැය ලේඛනමය පාලනය**

විශ්වවිද්‍යාල විද්‍යායතනය විසින් සමාලෝචිත වර්ෂය සඳහා වියදම් ඇස්තමේන්තුවක් සකසා තිබුණද 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 ඡේදය ප්‍රකාරව අයවැය ලේඛනයක් පිළියෙල කර අදාල වර්ෂය ආරම්භ වීමට මාස 03 කට පෙර පාලක මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විද්‍යායතනයේ අධ්‍යක්ෂකගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු විය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | අයවැය ලේඛනමය පාලනය | අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබීම. |
| (ආ) | ලේඛන පවත්වාගෙන යාම | ලෙජර් ගිණුම් සඳහා නිවැරදි සංකේත අංක ක්‍රමයක් භාවිතා කර නොතිබීම හා ලෙජර් ගිණුම් ක්‍රමවත්ව පවත්වා ගෙන ගොස් නොතිබීම. |
| (ඇ) | අත්තිකාරම් ලබාදීම | අත්තිකාරම් ලබාදීමේ නිවැරදි ක්‍රමවේදයක් ආයතනය විසින් හඳුන්වාදී නොතිබීම. |